සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

**දේශපාලන විද්‍යාව I**
அரசியல் விஞ்ஞானம் I
Political Science I

**23 S I**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**විභාග අංකය:** ....................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | **1 - 3** | |
| 2 | **4 - 11** | |
| 3 | **12 - 17** | |
| 4 | **18 - 23** | |
| 5 | **24 - 30** | |
| 6 | **31 - 37** | |
| 7 | **38 - 45** | |
| 8 | **46 - 50** | |
| **එකතුව** | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

**1.** දේශපාලන විද්‍යාව විෂයට අයත් වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) සංවිධාන චර්යාව (2) දේව ධර්මය (3) මානව පරිණාමය
(4) භාෂාව සහ සංස්කෘතිය (5) තුලනාත්මක ආණ්ඩුක්‍රමය (......)

**2.** දේශපාලන විද්‍යාවේ දාර්ශනික ප්‍රවේශය
(1) දේශපාලන අධ්‍යයනයේ නවතම ප්‍රවේශයන්ගෙන් එකකි.
(2) හැරල්ඩ් ලැස්වෙල් සහ ඩේවිඩ් ඊස්ටන් විසින් හඳුන්වාදෙන ලදී.
(3) ඇරිස්ටෝටල් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.
(4) ප්‍රධාන දේශපාලන සංකල්ප පිළිබඳ ප්‍රතිමානික අවබෝධය සපයයි.
(5) දේශපාලන අධ්‍යයනයට ආනුභවික විමර්ශන ක්‍රම හඳුන්වා දුන්නේ ය. (......)

**3.** නූතන රාජ්‍යය
(1) 17 වන සහ 19 වන සියවස් අතර කාලය තුළ ආසියාවේ පැන නැගිණි.
(2) ව්‍යවස්ථාදායක සහ විධායක කාර්යයන්ට සීමා වෙයි.
(3) ගෝලීයකරණය හේතුකොට ගෙන ඇතිවන අභියෝගවලට මුහුණ දෙයි.
(4) ඉඩම් හිමි පන්තියේ අභිලාෂ පිළිබිඹු කරයි.
(5) නම්‍යශීලී දේශසීමා මායිම් මත පදනම් වෙයි. (......)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**4.** ආණ්ඩුව
(1) අභ්‍යන්තර ස්වාධිපත්‍යය හිමිකර ගනියි.
(2) ස්ථිර ආයතනයකි.
(3) සමස්ත සමාජය වෙනුවෙන් තීරණ ගැනීමේ වගකීම උසුලයි.
(4) මුල්වරට පැන නැඟුණේ 18 වන සියවසේ ආසියාවේ දී ය.
(5) සෙසු සියලු සංවිධානවලට ඉහළින් සිටියි. (……)

**5.** ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණවලින් එකක් වන්නේ,
(1) දේශපාලන විධායකය සාමූහික වීමයි.
(2) ආණ්ඩුව ව්‍යවස්ථාදායකයට වගකීමයි.
(3) ආණ්ඩුවේ නායකත්වය සහ රාජ්‍යයේ නායකත්වය වෙන් වෙන් ව පැවතීමයි.
(4) ව්‍යවස්ථාදායකයේ විශ්වාසය මත ආණ්ඩුව පැවතීමයි.
(5) විධායක අධිකාරිත්වය ජනාධිපතිවරයා මත ඒකරාශීව පැවතීමයි. (……)

**6.** ලිබරල්වාදයේ ප්‍රධාන චින්තකයන්ගෙන් සමහරක් වූයේ
(1) ජෙරමි බෙන්තම්, ජෝන් ස්ටුවර්ට් මිල්, සහ ඇඩම් ස්මිත් ය.
(2) තෝමස් හොබ්ස්, එඩ්මන්ඩ් බර්ක්, සහ රොබට් නෝෂික් ය.
(3) ෂාන් ෂාක් රූසෝ (Jean Jacques Rousseau), වුඩ්රෝ විල්සන්, සහ මහත්මා ගාන්ධි ය.
(4) රොබට් ඕවන්, කාල්මාක්ස්, සහ ව්ලැඩිමීර් ලෙනින් ය.
(5) මේරි වුල්ස්ටන්ක්‍රාෆ්ට්, බෙටී ෆ්‍රීඩන්, සහ කේට් මිලට් ය. (……)

**7.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ
(1) රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙනස අපැහැදිලි ය.
(2) අධිකරණය සලකනු ලබන්නේ විධායකයේ ශාඛාවක් ලෙසිනි.
(3) පුද්ගල නිදහස සහ අයිතිවාසිකම්වලට ගරු කෙරේ.
(4) පුරවැසියන්ගේ මැතිවරණ දේශපාලන සහභාගිත්වය අධෛර්යයට පත් කෙරේ.
(5) පාලකයන් ජනතාවට වගවීමෙන් නිදහස් ය. (……)

**8.** "ධනවාදී සමාජ සහ ආර්ථික ක්‍රමය ගොඩනගනු ලබන්නේ ශ්‍රම සූරා කෑම මත ය" යන අදහස ඉදිරිපත් කරන ලද්දේ පහත සඳහන් දේශපාලන චින්තකයන් අතුරෙන් කවරෙකු ද?
(1) කාල් මාක්ස් (2) ජෝන් ලොක් (3) ඒ.වී. ඩයිසි
(4) ජීන් බොඩෑන් (Jean Bodin) (5) මොන්ටෙස්ක්‍යු (……)

**9.** සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
(1) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය අධෛර්යමත් කරයි.
(2) සමාජවාදී මතය පමණක් අවධාරණය කරයි.
(3) සමාජ සුබසාධනය වෙනුවෙන් පෙනී සිටියි.
(4) සමාජවාදය සඳහා විප්ලවකාරී මගක් දිරිමත් කරයි.
(5) ආර්ථිකය තුළ රාජ්‍ය මැදිහත්වීම වළක්වයි. (……)

**10.** ස්ත්‍රීවාදය
(1) සමාජය තුළ ස්ත්‍රී-පුරුෂභාවී වෙනස්කම් අනුමත කරයි.
(2) ස්ත්‍රීන් පුරුෂයින්ට වඩා උත්තරීතර බව ප්‍රකාශ කරයි.
(3) ගෘහමය කටයුතු ඉටුකරලීමට පමණක් ස්ත්‍රීන් දිරිමත් කරයි.
(4) ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වය අධෛර්යමත් කරයි.
(5) පීතෘ මූලික ආයතන විවේචනය කරයි. (……)

**11.** නිදහස් සහ සාධාරණ මැතිවරණ පැවැත්වීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසිවලින් එකක් වන්නේ,
(1) ආධිපත්‍ය සහිත ඒක පක්ෂ ක්‍රමයක් පැවතීමයි.
(2) කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමයක් තිබීමයි.
(3) බලසම්පන්න පොලිස් සහ සන්නද්ධ හමුදා පැවතීමයි.
(4) ක්‍රියාකාරී සමාජ මාධ්‍ය තිබීමයි.
(5) මැතිවරණ පැවැත්වීම සඳහා ස්වාධීන සහ බලවත් ආයතනයක් පැවතීමයි. (……)

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**12.** පහත සඳහන් සංකල්පවලට දෙන ලද විස්තර අතුරෙන් එකක් පමණක් නිවැරදි ය. නිවැරදි විස්තරය අයත් සංකල්පය තෝරන්න.

(1) ජාතිය - පොදු භාෂාවක්, ආගමක්, සම්ප්‍රදායන් සහ සංස්කෘතියක් හිමි කරගත් එමෙන්ම තමන් නිශ්චිත දේශපාලන ප්‍රජාවක් වශයෙන් ඔවුන්ම සළකන්නා වූ පුද්ගල කණ්ඩායමකි.

(2) බලපෑම් කණ්ඩායම් - පොදු අපේක්ෂාවන් සහ ඉහළ මට්ටමේ දේශපාලන කැපවීම් නිසා වෙන්කොට හඳුනාගත හැකි විශාල පුද්ගල සමූහයකි.

(3) සමාජ ව්‍යාපාර - රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වලට බලපෑම් කිරීමේ අරමුණින් ක්‍රියාකරන විධිමත් ජනතා සංවිධානයන් ය.

(4) සිවිල් සමාජය - ආණ්ඩු බලය දිනාගැනීමේ අරමුණින් සංවිධානය වූ ජන සමූහයන් ය.

(5) දේශපාලන පක්ෂය - ආණ්ඩුවේ පාලනය යටතේ ක්‍රියාකරන පුරවැසියන්ගේ සංවිධානයකි. (......)

**13.** සහසන්ධීය ක්‍රමයක් (a confederation) තුළ

(1) සන්ධීය ඒකක අතර ශක්තිමත් සම්බන්ධතාවක් පවත්වා ගැනේ.
(2) මධ්‍යය විසින්ම සිය බලතල තීරණය කරනු ලැබේ.
(3) ස්වාධිපත්‍යය මධ්‍යය සහ සන්ධීය ඒකක අතර බෙදා ගැනේ.
(4) සන්ධීය ඒකක මධ්‍යයට වඩා බලවත් ය.
(5) ජාතික මට්ටමේ විෂයයන් රාශියක් සම්බන්ධයෙන් බලය මධ්‍යයට තිබේ. (......)

**14.** ඇමෙරිකා එක්සත් ජනපදයේ සෙනෙට් සභාව

(1) ප්‍රාන්ත රාජ්‍ය 50 න් එක් එක් ප්‍රාන්තය සඳහා නියෝජිතයන් තිදෙනෙකු බැගින් තෝරා එවීමට ඉඩ සලසයි.
(2) ලෝකයේ වඩාත්ම බලගතු දෙවැනි මණ්ඩලය ලෙසින් සලකනු ලබයි.
(3) මහජන මන්ත්‍රී මණ්ඩලයට ව්‍යවස්ථාමය ලෙසින් යටත් වේ.
(4) මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරනු ලබන පනත් කෙටුම්පතක් වසරක් දක්වා ප්‍රමාද කිරීමේ බලය භුක්ති විඳී.
(5) ජනාධිපතිවරයා ඇතිකරගන්නා ගිවිසුම් අනුමත කිරීමේ බලයකින් තොර ය. (......)

**15.** පහත සඳහන් රට සහ එහි ආණ්ඩු ලක්ෂණය නිවැරදි ලෙසින් දක්වන විස්තරය තෝරන්න.

(1) ඇමෙරිකා එක්සත් ජනපදය - ජනාධිපතිවරයා සහ උප ජනාධිපතිවරයා සෑම වසර හතරකට වරක්ම ඡන්දයෙන් තෝරා පත් කර ගැනෙති.

(2) ඉන්දියාව - 19 වන සියවසේ දී කැබිනට් ආණ්ඩුක්‍රමය වර්ධනය විය.

(3) ප්‍රංශය - සෑම මහමැතිවරණයකින්ම පසුව ජාතික මන්ත්‍රණ සභාව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගනු ලැබේ.

(4) එක්සත් රාජධානිය - රාජාණ්ඩුවකින් තොර වූ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයකි.

(5) ස්විට්සර්ලන්තය - විධායක ශාඛාව වන්නේ පාර්ලිමේන්තුව විසින් තෝරා පත් කරනු ලබන කැබිනට් මණ්ඩලයයි. (......)

**16.** රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ආයතන වන්නේ,

(1) දේශපාලන පක්ෂ ය.
(2) අභිලාෂ කණ්ඩායම් ය.
(3) ප්‍රතිපත්ති උපදේශන කණ්ඩායම් ය.
(4) ස්ථිර විධායකය ය.
(5) සමාජ ව්‍යාපාර ය. (......)

**17.** නිදහසින් පසු අවධිය තුළ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩ ගස්වන ලද ප්‍රධාන සාධකය වන්නේ,

(1) පවුල් පැළැන්ති දේශපාලනය (dynastic politics) ය.
(2) මහජන මතය ය.
(3) මැතිවරණ පොරොන්දු ය.
(4) සාර්ක් සාමාජිකත්වය ය.
(5) බලයේ සිටින ආණ්ඩුවේ ප්‍රතිපත්ති ය. (......)

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**18.** ගැටුම්වල ජීවන චක්‍රය වෙතින් යෝජනා කෙරෙන්නේ,
(1) ගැටුම් යනු අවසානයක් නැති ක්‍රියාවලියක් බව ය.
(2) ගැටුම ස්ථිතික ක්‍රියාවලියක් බව ය.
(3) ගැටුම් කිසිවිටෙකවත් සාමකාමී ලෙසින් අවසන් නොවන බව ය.
(4) ගැටුම යනු ගතික ක්‍රියාවලියක් බව ය.
(5) ගැටුම් සෑම විටක දී ජය-ජය (win-win) විසඳුමක් ලබා දෙන බව ය. (……)

**19.** බලහත්කාරය මගින් විදේශ ප්‍රතිපත්ති අරමුණු ඉටුකරගන්නා මාධ්‍යයන්ට ඇතුළත් වන්නේ,
(1) රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා ය. (2) විදේශ ආධාර ය.
(3) ආර්ථික ගිවිසුම් ය. (4) ආර්ථික සම්බාධක ය.
(5) සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ය. (……)

**20.** 1648 වෙස්ට්ෆේලියානු සාම ගිවිසුම
(1) ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාමට ජාතීන්ගේ සංගමය (League of Nations) පිහිටු වී ය.
(2) ගිවිසුම් ගත වූ රාජ්‍යයන්ගේ භෞමික දේශසීමා තීරණය කෙළේ ය.
(3) යුරෝපා බලවතුන්ගේ යටත්විජිත පාලනයන් අවසන් කෙළේ ය.
(4) රාජ්‍ය පරමාධිපත්‍යය නොසළකා හැරියේ ය.
(5) යුරෝපයේ ආගමික නිදහස සීමා කෙළේ ය. (……)

● අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

**21.** යටත්විජිත ලංකාව සඳහා කෝල්බෲක්-කැමරන් කොමිසම නිර්දේශ කෙළේ
A - රාජ්‍ය නිර්බාධ ආර්ථිකයකි.
B - පොදු අධිකරණ ක්‍රමයක් පිහිටුවීමට ය.
C - ආණ්ඩුව මගින් පවත්වාගෙන යනු ලබන සියලු ස්වදේශික පාඨශාලා තහනම් කිරීමට ය.
D - සීමිත බලයක් සහිත ආණ්ඩුවක් ය.
E - ඒකාබද්ධ ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීමට ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**22.** 1910 සහ 1930 අතර කාලය තුළ හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ
A - ව්‍යවස්ථාදායක සභාව අනුක්‍රමයෙන් සිය බලතල වර්ධනය කර ගත්තේ ය.
B - ආණ්ඩුකාරයාගේ බලතල ක්‍රම ක්‍රමයෙන් අඩු කෙරිණ.
C - සීමිත ඡන්ද බලය සමග මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ මූලධර්මය හඳුන්වා දෙන ලදී.
D - ව්‍යවස්ථා ව්‍යුහය තුළ රැඩිකල් වෙනස්කම් සිදු කෙරිණි.
E - නිල නොලත් සාමාජිකයන්ගේ සංඛ්‍යාව වැඩි කෙරිණි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**23.** 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ
A - සෙනෙට් මණ්ඩලයේ සියලුම මන්ත්‍රීන් ධුර කාලය එකවර අවසන් නොකළහ.
B - අග්‍රාණ්ඩුකාරයාගේ ධුරය නිශ්චිත නිල කාලයකට සීමා නොවී ය.
C - අග්‍රාණ්ඩුකාරයාගේ කටයුතු කිසිදු අධිකරණයක දී අභියෝග කළ නොහැකි විය.
D - කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීමේ මූලධර්මය පිළි නොගැනිනි.
E - එක් එක් අමාත්‍යවරයා තම අමාත්‍යධුරයේ කටයුතු සම්බන්ධව පාර්ලිමේන්තුවට පෞද්ගලිකව වගකිව යුතු විය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**24.** 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව

A - බලතල වෙන්කිරීමේ මූලධර්මය නොතකා හැරී ය.

B - ප්‍රිවි කවුන්සිලයේ අධිකරණ කමිටුවට අභියාචනා කිරීමේ අයිතිය අහෝසි කෙළේ ය.

C - රාජ්‍යයේ ඒකීය ගතිලක්ෂණය පිළිගත්තේ ය.

D - යටතේ ජනාධිපතිවරයා ඔහුගේ නිල කටයුතු සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවට වග කී ය.

E - ස්වාධීන රාජ්‍ය සේවයක් පිළිබඳ සංකල්පය ප්‍රතික්ෂේප කෙළේ ය.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (......)

**25.** 1978 මුල් ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා

A - අගමැතිවරයා ධූරයෙන් පහ කිරීමට සහ කැබිනට් මණ්ඩලය සංශෝධනය කිරීමට බලය හිමි වූවෙකි.

B - පාර්ලිමේන්තුවට වගකිව යුතු නොවී ය.

C - වසර පහක ධූර කාලයක් සඳහා තෝරා ගනු ලැබිණි.

D - තම අභිමතයට අනුව සියලු ප්‍රධාන පත් කිරීම් සිදු කළේ ය.

E - පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද පනත් කෙටුම්පතක් ජනමත විචාරණයකට යොමු කිරීමේ බලය හිමි වූවෙකි.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (......)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධූරය නිර්මාණය කරන ලද්දේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 1977 වර්ෂයේ දී සිදු කරන ලද සංශෝධනයකිනි. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වාදීම මගින් ජනාධිපති ක්‍රමයට ගැළපෙන ලෙස සමස්ත ව්‍යවස්ථා ව්‍යුහය වෙනස් කරනු ලැබිණි. | (......) |
| **27.** | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපති ධූරය පුරප්පාඩු වුවහොත් ඉතිරි ධූර කාලය සඳහා පාර්ලිමේන්තුව විසින් එහි සාමාජිකයන් අතුරෙන් එක් අයකු ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කර ගත යුතු ය. | අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු තෝරා පත් කරගැනීමේ දී පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශිත ඡන්දවලින් පරම බහුතරයක් තිබීම අවශ්‍ය වේ. | (......) |
| **28.** | 1987 වසරේ දී ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම හේතු කොටගෙන දිවයිනේ රාජ්‍ය සේවයේ ප්‍රධාන වෙනසක් ඇති විය. | පළාත් රාජ්‍ය සේවයේ ප්‍රධානියා වන්නේ ප්‍රධාන අමාත්‍යවරයා ය. | (......) |
| **29.** | ශ්‍රී ලංකාවට මනාප ඡන්ද ක්‍රමය හඳුන්වා දෙනු ලැබූයේ 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. | ඡන්දදායකයකුට පාර්ලිමේන්තු මැතිවරණයක දී එකම පක්ෂයේ අපේක්ෂකයන් තිදෙනෙකුට මනාප තුනක් ප්‍රකාශ කළ හැකි ය. | (......) |
| **30.** | 1956-1977 අතර කාලය තුළ ද්වි පක්ෂ ක්‍රමය ශ්‍රී ලංකාවේ පක්ෂ දේශපාලනයේ ගතිලක්ෂණයක් විණි. | 1989 වසරේ සිට ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයක් කරා ගමන් කර තිබේ. | (......) |

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## B කොටස

**31.** ඓතිහාසික විකාශනය තුළ ආකෘති හෝ මාදිලි කිහිපයකට රාජ්‍යය වර්ගීකරණය කළ හැකි ය. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**32.** (1) රාජ්‍ය නිර්මාණ ගැටුම් (the state formation conflict) පිළිබඳ ලියා ඇති ශාස්ත්‍රඥයෙකු නම් කරන්න.

..........................................................................................

(2) 'තිරසර සාමය' පිළිබඳ සංකල්පය හඳුන්වා දුන් ශාස්ත්‍රඥයා නම් කරන්න.

..........................................................................................

**33.** පහත සඳහන් කෘතිවල කතුවරුන් නම් කරන්න.

(1) කොමියුනිස්ට් ප්‍රකාශනය

..........................................................................................

(2) ලෙවියාතන් (*Leviathan*)

..........................................................................................

**34.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රධාන වර්ග තුනකට බෙදා දැක්විය හැකි ය. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**35.** දේශපාලන පක්ෂ ක්‍රම වර්ග පහකට බෙදා දක්වනු ලැබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**36.** එක්සත් රාජධානියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කේන්ද්‍රීය මූලධර්ම කිහිපයක් මත පදනම් වේ. ඉන් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**37.** 'සමාජවාදී රාජ්‍යය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයෙන් මූලධාර්මිකව වෙනස් වේ.' වෙනස්කම් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**38.** සමාජවාදී ස්ත්‍රීවාදයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**39.** අර්ධ ජනාධිපති ක්‍රමයේ (semi-presidential system) ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**40.** ලෝකය තුළ භාවිතයට ගනු ලබන ප්‍රධාන මැතිවරණ ක්‍රම කිහිපයක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**41.** වර්තමානයේ ලෝක දේශපාලනයට බලපෑම් කරන ජාත්‍යන්තර ත්‍රස්තවාදී සංවිධාන **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**42.** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ සම්බන්ධතා හැඩගස්වා ඇති විදේශ ප්‍රතිපත්ති දිශානති **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**43.** (1) ලංකාවේ 'රාජකාරි ක්‍රමය' අහෝසි කරන ලද ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය කුමක් ද?

..............................................................................................................

(2) යටත් විජිත ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට පළමුවරට මැතිවරණ මූලධර්මය (elective principle) හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය කුමක් ද?

..............................................................................................................

**44.** සුළුතර ප්‍රජාවන්ගේ අභිලාෂ ආරක්ෂා කිරීමට ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ගන්නා ලද ක්‍රියාමාර්ග **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**45.** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ දෙකක් පැවැත්විණි. ඒවා පැවැත්වූයේ කුමන වර්ෂවල දී ද?

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

[අටවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**46.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට මුල් වූ හේතු **දෙකක්** නම් කරන්න.

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

**47.** (1) ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා පත් කරන ලද්දේ කවරෙකු විසින් ද?

................................................................................................................................

(2) ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ නිල කාලය වසර කීය ද?

................................................................................................................................

**48.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලතල ක්ෂේත්‍ර කිහිපයක් ඇත. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

**49.** ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ ස්වාධීන කොමිෂන් සභා නවයක් පිහිටුවන ලදී. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

**50.** සරල බහුතර නියෝජන ක්‍රමයේ අවාසි **දෙකක්** දක්වන්න.

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

※ **I** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, **II** කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **III** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 20)

**2.** පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** විස්තර කරන්න.

(i) රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාව

(ii) රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙනස්කම්

(iii) ජාතික රාජ්‍යය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම (ලකුණු $10 \times 2 = 20$)

**3.** පහත සඳහන් දේශපාලන මතවාදවලින් (ideologies) ඕනෑම **දෙකක** ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න.

(i) ලිබරල්වාදය

(ii) සමාජවාදය

(iii) ෆැසිස්ට්වාදය (ලකුණු $10 \times 2 = 20$)

## II කොටස

**4.** ඩොනමෝර් ව්‍යවස්ථාව මගින් ප්‍රදානය කරන ලද සර්වජන ඡන්ද බලයේ දේශපාලන සහ සමාජ බලපෑම විමර්ශනය කරන්න. (ලකුණු 20)

**5.** 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත සඳහන් අංග **දෙකක්** කෙටියෙන් සාකච්ඡා කරන්න.

(i) අග්‍රාණ්ඩුකාරයා

(ii) සෙනේට් මණ්ඩලය

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(iv) පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍යය (ලකුණු $10 \times 2 = 20$)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/
[අනෙක් පිටුව බලන්න.

**6.** 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාවේ සංයුතිය හා උත්තරීතරභාවය පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**7.** ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට අදාළව පහත සඳහන් තේමා සාකච්ඡා කරන්න.

(i) ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ක්‍රමය (ලකුණු 05)

(ii) ජනාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන් (ලකුණු 15)

## III කොටස

**8.** පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පැහැදිලි කරන්න.

(i) ඉන්දියානු සංධීයවාදයේ ප්‍රධාන ලක්ෂණ

(ii) වර්තමාන ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන්

(iii) ඇමෙරිකානු මධ්‍යම ආණ්ඩුවේ බලතල (ලකුණු 10 × 2 = 20)

**9.** 2015න් පසුව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 20)

**10.** පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්වලට හේතු

(ii) රාජ්‍ය ප්‍රතිපත්ති සහ නිලබලතන්ත්‍රය අතර සම්බන්ධතාව

(iii) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්තමාන ප්‍රවණතා

(iv) ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමය පිළිබඳ ඇති විවේචන

(v) ජාත්‍යන්තර දේශපාලනය තුළ රාජ්‍ය නොවන ක්‍රියාධරයන්ගේ කාර්යභාරය (ලකුණු 10 × 2 = 20)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/